# 2019

## වාර්ෂික කාර්යසාධන වාර්තාව

### வருடாந்த செயற்திறன் அறிக்கை

# Annual Performance Report

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

மாநகர மற்றும் மேல் மாகாண அபிவிருத்தி அமைச்சு

Ministry of Megapolis and Wester Development

**මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය**

**(වර්තමාන නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය)**

**වැය ශීර්ෂ අංක:162**

# වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2019


**17 මහල, සුහුරුපාය, සුභූතිපුර පාර, බත්තරමුල්ල**

**දුරකථන : 0112 864 770 /0112 866 447**

**ෆැක්ස් : 0112 887 909**

**විද්‍යුත් තැපැල : info@megapolismini.gov.lk**

**වෙබ් අඩවිය : www.megapolismin.gov.lk**

# පටුන


**පරිච්ඡේද** **පිටු අංක**

**01. පරිච්ඡේදය**

**1. ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය................................................................. 01 - 02**

1.1 හැඳින්වීම....................................................................................................... 01

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු.................................................................. 01

1.3 ප්‍රධාන කාර්යයන්.............................................................................................. 01

1.4 සංවිධාන සටහන............................................................................................... 02

1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු.................................................. 02

1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන.................................................................. 02

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු...................................................... 02

අ) ව්‍යාපෘතියේ නම...............................................................................

ආ) දායක නියෝජිතායතනය....................................................................

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම.....................................................

ඇ) ව්‍යාපෘති කාල සීමාව.........................................................................

**02. පරිච්ඡේදය**

**2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම........................................................................................................ 03 - 04**

2.1 විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක.................................................... 03 - 04

**03. පරිච්ඡේදය**

**3. 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය.......... 05 - 09**

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය............................................................................... 05

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය......................................................................... 06

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය............................................................................. 07

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්........................................................................................ 08

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය................................................................. 09

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය...................... 09

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන.......................................................................................... 09

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය........................................ 09

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව.......................................................................... 09

**04. පරිච්ඡේදය**


**4. කාර්යසාධන දර්ශක.......................................................................................................... 10**

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)........................ 10


**05. පරිච්ඡේදය**


**5. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය............................................... 11 - 13**

5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු.................................................... 11

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග........................... 12-13


**06. පරිච්ඡේදය**


**6. මානව සම්පත් පැතිකඩ.......................................................................................... 14 - 22**

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය.............................................................................. 14

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේද?..................................................................................... 14

6.3 මානව සම්පත් සංවර්ධනය.................................................................................... 14-22


**07. පරිච්ඡේදය**


7. අනුකූලතා වාර්තාව.................................................................................................. 23-28

# 01. පරිච්ඡේදය

## 1. ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1 හැඳින්වීම

2015 සැප්තැම්බර් මස 21 දිනැති අංක 1933/13 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය පිහිටුවන ලදී. 2019 දෙසැම්බර් 10 දින අංක 2153/12 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් මෙම අමාත්‍යාංශය නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය නමින් නැවත පිහිටුවනු ලැබීමෙන් පසු පෙර පැවති මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යටතේ පැවති දෙපාර්තමේන්තු, ආයතන හා ව්‍යාපෘති යනාදිය මෙම නව අමාත්‍යාංශයේ විෂය පථය යටතට පැවරිණි.

2019 වර්ෂයේ සිට ක්‍රියාත්මකවන පරිදි වාර්ෂික කාර්යසාධන වාර්තා සකස් කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අංක PFD/RED/COPA/2019/01 හා 2020.01.30 දිනැති ලිපියෙන් හඳුන්වාදෙනු ලැබ ඇති විශේෂ ආකෘති පත්‍රයට අනුව 2019 මූල්‍ය වර්ෂයට අදාලව මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් ඉටුකරනු ලැබ ඇති කාර්යයන් පිළිබඳ තොරතුරු ඇතුළත් කරමින් මෙම වාර්තාව සකස් කර ඇත.

### 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

**දැක්ම**

ජනතාවගේ ආර්ථික හා ආධ්‍යාත්මික යහපැවැත්ම මෙන්ම ස්වභාව ධර්මය සමග සුසංයෝගී වූ ප්‍රියමනාප දිවිපැවැත්මක් සහතික කරන තිරසර නාගරික ජීවිතයක්

**මෙහෙවර**

විශිෂ්ට නගර සැලසුම් හා ඉංජිනේරු නිපුණතා, අතිනවීන තාක්ෂණය සහ ලෝකයේ විශිෂ්ට භාවිතාවන් යොදා ගනිමින්, රටේ ක්‍රමෝපායික වශයෙන් වැදගත් ස්ථානවල මැනවින් සැලසුම් කරන ලද හරිත, පවිත්‍ර නාගරික ජනාවාස නිර්මාණය කිරීම තුළින් දේශයේ ආර්ථික සමෘද්ධිය සාක්ෂාත් කරගැනීම සහ ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම

**අරමුණු**

අමාත්‍යාංශයේ මූලික අරමුණ වන්නේ ජන ජීවිතයේ ගුණාත්මකභාවය ඉහළ මට්ටමකින් පවත්වා ගන්නා අතරම නාගරික ප්‍රදේශවල වාසය කරන ජනතාව රටේ සමාජ ආර්ථික සංවර්ධන ක්‍රියාදාමයේ කොටස්කරුවන් වන බවට සහතික කරන්නා වූ විධිමත් වෙනස්කම් සහ සංවර්ධන ක්‍රියාදාමයන් නාගරික ප්‍රජාව වෙත ගෙන ඒමය. මෙමගින් ශ්‍රී ලංකාව ආසියාවේ වාණිජ, නාවික හා ගුවන් කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමේ මග සැලසෙයි.

මෙම අමාත්‍යාංශයේ මූලික වගකීම් අතරට සමස්ත ශ්‍රී ලංකාවටම අදාළ ජාතික භෞතික සැලසුම සකස් කිරීමත්, උපාය මාර්ගික හා පොදු නාගරික සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීමත් ඇතුළත් වේ. රටේ ක්‍රමෝපායික වශයෙන් වැදගත් ස්ථානයන්හි නාගරික ජනාවාස සැලසුම් කිරීමට අමතරව නාගරීකරණය නිසා නිර්මාණය වූ කැලිකසල, මුඩුක්කු, බලශක්තිය, රථවාහන තදබදය, පරිසරය සහ ජීවනෝපාය ආශ්‍රිතව හටගත් නිශ්චිත ගැටලු සඳහා අවශ්‍ය විසඳුම් ලබාදීමට ද වැයම් කරනු ඇත.

### 1.3 ප්‍රධාන කාර්යයන්

- මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථයට අදාල හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතනවල විෂයන්ට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සකස් කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

- කොට්ටාව, කඩුවෙල සහ කඩවත නගර සංවර්ධන ව්‍යාපෘතිය හා ඊට අදාල කටයුතු

- නාගරික ප්‍රදේශවල ආර්ථික, සමාජීය හා භෞතික සංවර්ධනය ඒකාබද්ධව විධිමත් ලෙස ප්‍රවර්ධනය කිරීම හා නියාමන කටයුතු දිරිගැන්වීම
- නාගරික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය
- පහත් බිම් ගොඩකිරීම හා සංවර්ධනයට අදාල කටයුතු
- නාගරික ප්‍රදේශවල පිහිටි සේවා හා පහසුකම් අඩු ප්‍රදේශ සහ වගුරු බිම්, පොදු සැලැස්මකට අනුව සංවර්ධනය කිරීමට අවශ්‍ය මග පෙන්වීම
- ජාතික භෞතික සැලසුම් හා ප්‍රාදේශීය භෞතික සැලසුම් පිළියෙළ කිරීම
- නාගරික සංවර්ධනයක් සහතික කිරීම සඳහා ජාතික භෞතික සැලසුම පදනම් කරගෙන සියලු ඉදිකිරීම් කටයුතු මෙහෙයවීම හා නියාමනය සිදු කිරීම
- අමාත්‍යාංශයේ විෂයපථයට ගැනෙන ආයතන අධීක්ෂණය කිරීම

## 1.4 සංවිධාන සටහන

පිටු අංක 29හි දක්වා ඇත.

## 1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

## 1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන

නාගරික සංවර්ධන අධිකාරිය

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව

## 1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

| # | ව්‍යාපෘතියේ නම | | දායක නියෝජිතායතනය | ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම (ඇ.ඩො.මි.) | | ව්‍යාපෘති කාල සීමාව |
|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | |
| 1 | උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය | මහනුවර හා ගාල්ල | ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර බැංකුව (ලෝක බැංකුව) | 45 | 147 | 2014 - 2021 |
| | | යාපනය | | 10 | 55 | 2016 – 2021 |
| | | අනුරාධපුරය | ප්‍රංශ සංවර්ධන ඒජන්සිය | 10 | 57.5 | 2016 – 2021 |
| | | නාගරික සංවර්ධන ව්‍යාපෘති සඳහා පහසුකම් සැලසීම | ආසියානු සංවර්ධන බැංකුව | 1 | 5 | 2019 - 2021 |
| 2 | කොළඹ අගනගරය ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය | | ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර බැංකුව (ලෝක බැංකුව) | 108 | 213 | 2012 - 2020 |
| **3** | සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතිය | | ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය | 350 | 1,850 | 2017 - 2026 |

# 02. පරිච්ඡේදය

## 2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

### 2.1. විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

**විශේෂ ජයග්‍රහණ**

- ප්‍රවාහන ක්ෂේත්‍රයේ නව පියවරක් සනිටුහන් කරමින් ශ්‍රී ලංකාවේ පළමු බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය 2019 මාර්තු 31 දින කොට්ටාව මාකුඹුරේදී ජනතා අයිතියට පත් කිරීම
- 2019 වර්ෂය තුල නිවාස ඒකක 3,155ක ඉදිකිරීම් අවසන් කිරීම සහ කොළඹ නගරයේ තෝරාගත් පැල්පත් හා අඩු ආදායම්ලාභී පවුල් 2,700ක් නැවත පදිංචි කරවීම
- තිරසර නාගරිකරණය වැඩිදියුණු කිරීම උදෙසා ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 63ක් ජනතා අයිතියට පත් කිරීම

| | | |
|---|---|---|
| බස්නැවතුම්පොළ | - | 10 |
| සතිපොළ | - | 10 |
| බහුකාර්ය ගොඩනැගිලි | - | 11 |
| වාහන රථ ගාල් | - | 06 |
| පොදු පරිශ්‍ර හා විනෝදාත්මක පහසුකම් | - | 18 |
| ආගමික ස්ථානවල පොදු පහසුකම් සංවර්ධනය | - | 08 |

- ජාතික භෞතික සැලසුම ප්‍රකාශයට පත් කිරීම

  රටේ සියලු සංවර්ධන කටයුතු සඳහා මඟ පෙන්වන ජාතික භෞතික සැලසුම 2019.06.12 දිනැති අංක 2127/15 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කිරීම

- කොළඹ වරාය නගර ව්‍යාපෘතිය
  - සම්පූර්ණ ව්‍යාපෘති ප්‍රදේශය වන හෙක්ටයාර 446.61 හි (වරාය නගරය හෙක්ටයාර 269.37 සහ කළපු හා කෘතිම වෙරළ හෙක්ටයාර 177.24) ගොඩකිරීම් අවසන් කිරීම
  - යෝජිත වරාය නගරයේ යටිතල පහසුකම් ගොඩනැංවීම ආරම්භ කිරීම
  - අංක 2137/57 සහ 2019.08.21 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් අදාල භූමි ප්‍රදේශය "නාගරික සංවර්ධන ප්‍රදේශයක්" ලෙස ප්‍රකාශයට පත් කිරීම
  - රාජ්‍ය ඉඩම් ආඥාපනතෙහි 6 (1) වගන්තිය අනුව රජයේ විශේෂ ප්‍රදානයක් ලෙස යෝජිත වරාය නගර භූමිය, නාගරික සංවර්ධන අධිකාරිය වෙත පැවරීම

**අභියෝග**

*මූල්‍යමය අභියෝග*

- අයවැය මගින් ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන වෙන්කළ නමුත් අවශ්‍ය අක්මුදල් නියමිත පරිදි නොලැබීම

*වෙනත් අභියෝග*

පාස්කු ප්‍රහාරය හේතුවෙන් ඇති වූ අහිතකර බලපෑම්

- සිංහල අවුරුදු උත්සවය වෙනුවෙන් ගම්බිම් බලා ගිය දේශීය ශ්‍රමිකයින් නැවත නොපැමිණීම
- හදිසි නීතිය පැවති කාලය තුල විදේශීය පුහුණු / නුපුහුණු ශ්‍රමිකයින් වැඩබිම්වලට නොපැමිණීම
- වෙඩිබෙහෙත් සම්බන්ධ සීමාවන් යටතේ ඉදිකිරීම් අමුද්‍රව්‍ය (කළුගල්) සපයා ගැනීමට නොහැකි වීම
- ආරක්ෂක හේතු මත රාත්‍රී වැඩමුර ක්‍රියාත්මක කළ නොහැකි වීම

- විශේෂ ආරක්ෂක කලාප ආශ්‍රිතව ක්‍රියාත්මක ව්‍යාපෘති තාවකාලිකව නතර කිරීමට සිදුවීම
- වීසා නිකුත් කිරීමේ ගැටළු හේතුවෙන් ව්‍යාපෘති සඳහා විදේශීය විශේෂඥ සහාය ලබාගැනීමට නොහැකි වීම

**<u>ඉදිරි ඉලක්ක</u>**

- ඉදිකෙරෙමින් පවතින පොම්පාගාර සහ උමං මාර්ග ව්‍යාපෘති නිසි ලෙස අවසන් කර ඉදිරි ගංවතුර තත්ත්වයන් සඳහා කොළඹ නාගරික බල ප්‍රදේශය සූදානම් කරවීම

- සැහැල්ලු දුම්රිය පද්ධති ව්‍යාපෘතිය ස්ථාපිත කිරීම තුලින් බස්නාහිර පළාත තුළ කාර්යක්ෂම හා ඵලදායී පොදු ප්‍රවාහන සේවාවක් ඇතිකිරීම

- නාගරික ඝණ අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 1,200ක් දෛනිකව බැහැර කිරීම සඳහා සකස්කෙරෙන සනීපාරක්ෂක කසල රඳවනයේ ඉදිකිරීම් 2020 වර්ෂයේදී අවසන් කිරීම

# 03. පරිච්ඡේදය

## 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

### 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| අයවැය 2019 | | සටහන | සත්‍ය 2019 | සත්‍ය 2018 | |
|---|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | - 4 | - | - | ඒසීඒ-1 |
| - | මුළු ආදායම් ලැබීම් (අ) | | - | - | |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 29,266,135,908 | 21,058,569,526 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 1,140,917,027 | 491,009,532 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම | | 8,529,656 | 8,861,085 | ඒසීඒ-5 |
| - | වෙනත් ලැබීම් | | 82,285,848 | 3,276,629,370 | |
| - | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | 30,497,868,439 | 24,835,069,513 | |
| - | මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ) | | 30,497,868,439 | 24,835,069,513 | |
| | අඩුකළා : වියදම් | | | | |
| - | පුනරාවර්තන වියදම් | | - | - | ඒසීඒ-2(ii) |
| 116,580,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 107,841,303 | 97,848,559 | ඒසීඒ-2(ii) |
| 251,550,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 221,015,537 | 425,399,133 | ඒසීඒ-2(ii) |
| 365,660,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම | 7 | 1,157,559 | 181,684,994 | ඒසීඒ-2(ii) |
| - | පොළී ගෙවීම් | 8 | – | - | ඒසීඒ-2(ii) |
| 100,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 51,000 | 115,500 | ඒසීඒ-2(ii) |
| 733,890,000 | මුළු පුනරාවර්තන වියදම් (ඈ) | | 330,065,399 | 705,048,186 | |
| | මූලධන වියදම් | | | | |
| 6,000,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | 3,827,975 | 2,189,429 | ඒසීඒ-2(ii) |
| 556,100,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 11 | 367,065,885 | 4,791,824 | ඒසීඒ-2(ii) |
| 4,416,540,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | 2,258,498,734 | 1,666,876,000 | ඒසීඒ-2(ii) |
| | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | ඒසීඒ-2(ii) |
| 500,000 | හැකියා වර්ධනය | 14 | 379,000 | 1,059,800 | ඒසීඒ-2(ii) |
| 53,030,000,000 | වෙනත් මූලධන වියදම් | 15 | 42,353,358,621 | 29,741,355,099 | ඒසීඒ-2(ii) |
| 58,009,140,000 | මුළු මූලධන වියදම් (ඉ) | | 44,983,130,215 | 31,416,272,152 | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඊ) | | 151,804,169 | 231,471,206 | |
| - | තැන්පතු ගෙවීම් | | 141,921,563 | 219,901,142 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගෙවීම් | | 9,882,606 | 11,570,064 | ඒසීඒ-5 |
| - | මුළු වියදම් උ = (ඈ+ඉ+ඊ) | | 45,464,999,783 | 32,352,791,544 | |
| - | 2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ) | | (14,967,131,344) | (7,517,722,031) | |

## 3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය
2019 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | සත්‍ය 2019 | 2018 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 175,602,083 | 170,114,492 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 345,403,807 | 21,624,877 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | 3,050 | - |
| මුළු වත්කම් | | 521,008,940 | 191,739,369 |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| ශුද්ධ වත්කම් | | (1,692,622,446) | (694,979,933) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 175,602,083 | 170,114,492 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | 322,425,980 | - |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 1,715,600,273 | 716,604,810 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | 3,050 | - |
| මුළු වගකීම් | | 521,008,940 | 191,739,369 |

පිටු අංක 05 සිට 56 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 57 සිට 90 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමග එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : 2020.02.28 | දිනය : | දිනය : 27/02/2020 |

ආචාර්ය (ඉංජි.) ප්‍රියත් බන්දු වික්‍රම
ලේකම්
නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ
නිවාස පහසුකම් අමාත්‍යාංශය
17 වන මහල, "සුහුරුපාය", බත්තරමුල්ල

එච්. පී. ලලිත් කුමාර
ප්‍රධාන ගණකාධිකාරී
නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ
නිවාස පහසුකම් අමාත්‍යාංශය
17 වන මහල, "සුහුරුපාය", බත්තරමුල්ල

## 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | සටහන | 2019 රු. | 2018 රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| මුළු බදු ලැබීම් | | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | | - | - |
| ලාභ | | - | - |
| ආදායම් නොවන ලැබීම් | | 1,223,202,874 | 3,767,348,351 |
| වෙනත් දෙපාර්තමේන්තු/අමාත්‍යාංශ මගින් එකතු කරන ලද ආදායම් | | - | - |
| අග්‍රිම ලැබීම් | | 29,266,135,908 | 21,058,569,526 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ) | | 30,489,338,782 | 24,825,917,877 |
| **අඩුකළා : මුදල් වැය කිරීම** | | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | | 328,840,360 | 520,874,925 |
| සහනාධාර සහ මාරුකිරීම් | | 30,151,648,300 | 24,296,253,156 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | | 1,711,729 | - |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | | - | - |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ) | | 30,482,200,389 | 24,817,128,081 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ) | | 7,138,393 | 8,789,796 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| පොළී | | - | - |
| ලාභාංශ | | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | - | - |
| උපණය අයකර ගැනීම | | | |
| අත්තිකාරම් අයකර ගැනීම් | | 7,574,315 | 7,344,892 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ) | | 7,574,315 | 7,344,892 |
| **අඩුකළා : මුදල් වැය කිරීම** | | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්කර ගැනීම | | 4,827,052 | 4,734,324 |
| අත්තිකාරම් ගෙවීම් | | 9,882,606 | 11,400,364 |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ) | | 14,709,658 | 16,134,688 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ) | | (7,135,343) | (8,789,796) |
| මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ) | | 3,050 | (0) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| දේශීය ණය ගැනීම් | | - | - |
| විදේශීය ණය ගැනීම් | | - | - |
| ප්‍රදානයන් ලැබීම් | | - | - |
| තැන්පතු ලැබීම් | | | |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ) | | - | - |
| **අඩුකළා : මුදල් වැය කිරීම** | | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| තැන්පතු ගෙවීම් | | | |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ) | | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ) | | - | - |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ) -(ඒ) | | 3,050 | - |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | | - | - |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | 3 | - | - |

## 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තාකිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2019 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2019 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

### 3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුවට | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| අදාල නොවේ | | | | | |

### 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

| ප්‍රතිපාදන වර්ගය | වෙන්කරන ලද ප්‍රතිපාදන (රු.) | | භාණ්ඩාගාර වාර්තා අනුව වියදම (රු.) | අතැති බිල්පත් 2019.12.31 (රු.) | මුළු වියදම අතැති බිල්පත් සමග (රු.) | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | | | |
| පුනරාවර්තන | 737,000,000.00 | 733,890,000.00 | 330,065,400.00 | 366,000,000.00 | 696,065,400.00 | 95% |
| ප්‍රාග්ධන | 48,992,000,000.00 | 58,009,140,000.00 | 44,983,130,215.00 | 10,033,530,000.00 | 55,016,660,215.00 | 95% |

### 3.7 මු.රෙ. 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

| | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම (රු.) | ලැබුණු ප්‍රතිපාදනවලින් උපයෝගී කරගත් ප්‍රමාණය (% ලෙස) |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන (රු.) | අවසාන ප්‍රතිපාදන (රු.) | | |
| 1 | මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය | උපාධිධාරී අභ්‍යාසලාභීන්ට වැටුප් ගෙවීම | - | 1,520,000.00 | 1,468,666.54 | 96% |

### 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

| වත්කම් කේතය | කේත විස්තරය | 2019.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ශේෂය (රු.) | 2019.12.31 දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය (රු.) | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | - | - | - | - |
| 9152 | යන්ත්‍රෝපකරණ | 52,186,202.00 | 52,186,202.00 | නැත | 100% |
| 9153 | ඉඩම් | - | - | - | - |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | - |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | - | - | - |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | - | - |

### 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ඇමුණුම අංක 1හි දැක්වේ.

# 04. පරිච්ඡේදය

## 4. කාර්යසාධන දර්ශක

### 4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| # | විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|---|
| | | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| 1 | නිවාස | | | |
| 1.1 | ඉදිකෙරෙන ව්‍යාපෘතිවල නිමැවුම | - | 86% | - |
| 1.2 | ඉදිකිරීම් අවසන් කිරීම | 98% | - | - |
| 1.3 | නැවත පදිංචි කිරීම | - | 84% | - |
| 2 | සනීපාරක්ෂක කසළ රැඳවුම ඉදිකිරීම | 93% | - | - |
| 3 | පොදු ප්‍රවාහන යටිතල පහසුකම් ඉදිකිරීම | - | - | 68% |
| 4 | ගංවතුර බලපෑම් කළමනාකරණය කිරීම | - | 81% | - |

## 05.පරිච්ඡේදය

## 5. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

### 5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු :

| අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-74% | 75%-100% |
| 11. නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම | 11.1 - 2030 වන විට සියලුම දෙනාට ප්‍රමාණවත් ආරක්ෂාකාරී සහ අඩුම මිලට ලබා ගත හැකි නිවාස සහ මූලික සේවාවන් වෙත ප්‍රවේශය තහවුරු කිරීම සහ පැල්පත් නිවාස වැඩිදියුණු කිරීම | ඉදිකෙරෙන ව්‍යාපෘතිවල නිමැවුම | - | - | 86% |
| | | ඉදිකිරීම් අවසන් කිරීම | - | - | 98% |
| | | නැවත පදිංචි කිරීම | - | - | 84% |
| | 11.2 - විශේෂයෙන්ම අවදානමට ලක් විය හැකි තත්වයේ සිටින කාන්තාවන්, ළමුන්, ආබාධ සහිත පුද්ගලයින්, සහ වයස්ගත පුද්ගලයින්ට විශේෂ අවධානය යොමු කරමින් මහාමාර්ගවල ආරක්ෂාව ඉහල නැංවීම, පොදු ප්‍රවාහන පද්ධති සැලකිය යුතු මට්ටමින් ව්‍යාප්ත කිරීම මගින් 2030 වන විට සියලුම දෙනාට ආරක්ෂාකාරී අඩු මිලට ලබා ගත හැකි ප්‍රවේශවිය හැකි සහ තිරසර ප්‍රවාහන පද්ධති ලබා දීම | පොදු ප්‍රවාහන යටිතල පහසුකම් ඉදිකිරීම | - | 68% | - |
| | 11.5 - 2030 වන විට දරිද්‍රතාවෙහි සහ අවදානමට පත්විය හැකි තත්වයන්හි සිටින පුද්ගලයින් සම්බන්ධයෙන් අවධානය යොමු කරමින් ජලය මගින් සිදුවන්නා වූ විනාශයන්ද ඇතුළු ආපදාවලින් ලෝකයේ දළ දේශීය නිෂ්පාදිතයට සිදුවන සෘජු ආර්ථික හානිය සැලකිය යුතු ලෙස අඩු කිරීම සහ මෙමගින් බලපෑමට හා මරණයට පත් වන පුද්ගලයින්ගේ සංඛ්‍යාව කැපී පෙනෙන ලෙස අඩු කිරීම | ගංවතුර බලපෑම් කළමනාකරණය කිරීම | - | - | 81% |
| | 11.6 - 2030 වන විට විශේෂයෙන්ම වාතයේ ගුණාත්මකභාවය සහ නාගරික සහ වෙනත් අපද්‍රව්‍ය කළමනාකරණය ඇතුළත්ව නගර නිසා සිදුවන ඒක පුද්ගල අහිතකර පරිසර බලපෑම අඩු කිරීම | සනීපාරක්ෂක කසළ රැඳවුම ඉදිකිරීම | - | - | 93% |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග :

| අංශය | ඉලක්ක | ජයග්‍රහණ | අභියෝග |
|---|---|---|---|
| නිවාස | අඩු ආදායම්ලාභීන් වෙනුවෙන් දැරිය හැකි මිලකට නිවාස ඉදිකිරීම | – වාර්ෂික ඉලක්කයට සාපේක්ෂව නිවාස ඉදිකිරීම් කටයුතු 98%ක් හා නැවත පදිංචි කිරීම 84%ක් සපුරා ගැනීම<br>– ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුණය ක්‍රමය යටතේ ඉදිකිරීමට යෝජිත නිවාස ව්‍යාපෘති සම්බන්ධ (ඒකක 5,346) ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීම<br>– චීන රජයේ ආධාර යටතේ ඉදිකිරීමට යෝජිත නිවාස ව්‍යාපෘති (ඒකක 1,888) සම්බන්ධ මූලික සැලසුම් සකස් කිරීම | – අත්මුදල් නිසි වේලාවට නොලැබීම<br>– නිවාස සංකීර්ණ සඳහා විදුලි සම්බන්ධතා ලබාදීමේ දී සිදු වූ ප්‍රමාදය<br>– පාස්කු ප්‍රහාරය |
| ප්‍රවාහන | කාර්යක්ෂම හා නවීන ප්‍රවාහන සේවා සහ පහසුකම් සැපයීම | – කාර්යක්ෂම පොදු ප්‍රවාහන මාධ්‍යයක් වන සැහැල්ලු දුම්රිය ප්‍රවාහන පද්ධතියක් ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාත ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීමේ මූලික කටයුතු ආරම්භ කිරීම<br>– ශ්‍රී ලංකාවේ පළමු බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ඇරඹීමේ අත්දැකීම් ද සහිතව දෙවන බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය කඩවත ප්‍රදේශයේ ආරම්භ කළ අතර 2019 වන විට එහි පළමු අදියරෙහි ඉදිකිරීම් වලින් 95%ක් අවසන් කිරීම හා දෙවන අදියරේ ඉදිකිරීම් ආරම්භ කිරීම | – මහජන විරෝධතා<br>– ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සංකීර්ණ වීම හා ඊට ගත වන කාලය |
| ගං වතුර කළමනා කරණය | මහ කොළඹ ගං වතුර පාලනය සඳහා පොම්පාගාර හා උමං මාර්ග ඉදිකිරීම | – පොම්පාගාර ඉදිකිරීමේ ප්‍රගතිය -<br>අඹතලේ ජල පොම්පාගාරය 70%<br>ශාන්ත සෙබස්තියන් (උතුර) 75%<br>ශාන්ත සෙබස්තියන් (දකුණ) 45%<br>– වැසි ජල අපවහනය සඳහා උමං මාර්ග ඉදිකිරීම/ වැඩිදියුණු කිරීම<br>i) නව මුතුවැල්ල උමග - විෂ්කම්භය මීටර් 3ක් හා දිග මීටර් 777ක් වන උමං මාර්ගයේ මීටර් 135ක ඉදිකිරීම් අවසන් කිරීම<br>ii) ටොරින්ටන් උමං මාර්ග ජාලය - රාජකීය විද්‍යාලය, තුරඟ තරඟ පිටිය, කොළඹ විශ්වවිද්‍යාලය, තර්ස්ටන් විද්‍යාලය, රීඩ් මාවත, බගතලේ පාර, පොලිස් පාර්ක් ඇතුළු ප්‍රදේශවල ගංවතුර පාලන කටයුතු සඳහා විෂ්කම්භය මීටර් 3ක් හා දිග මීටර් 1,100ක් වන ප්‍රධාන උමං මාර්ගය හා එම විෂ්කම්භය සහිත දිග මීටර් 2,590ක් වන ද්විතියික උමං ජාලය ඉදිකිරීමේ ප්‍රගතිය - 47% | – පාස්කු ප්‍රහාරය<br>ශ්‍රම හිඟය, රාත්‍රී වැඩ මුර නතර වීම, අධි ආරක්ෂිත කලාපවල ඉදිකිරීම් නතර කිරීම, වෙඩි බෙහෙත් සම්බන්ධයෙන් පැවති සීමාවන් හේතුවෙන් ඉදිකිරීම් අමුද්‍රව්‍ය සපයා ගැනීමට නොහැකි වීම<br>– අධික වැසි තත්වය<br>අගෝස්තු හා සැප්තැම්බර් මාසවල පැවති අධික වර්ෂාව හේතුවෙන් ගංවතුර අවදානම සහිත වූ ප්‍රදේශවල සිදුකෙරෙන ව්‍යාපෘති කටයුතු අඩාල වීම |

| අංශය | ඉලක්ක | ජයග්‍රහණ | අභියෝග |
|---|---|---|---|
| ඝන අපද්‍රව්‍ය | නාගරික ඝණ අපද්‍රව්‍ය සඳහා දිගුකාලීන විසඳුම් ලබාදීම | – අරුවක්කාළු කසළ රඳවනයේ අර්ධයක් නිමකිරීම හා දිනකට ඝන අපද්‍රව්‍ය මෙ.ටො. 600ක් බැහැර කිරීම සඳහා පහසුකම් සැලසීම<br>– අරුවක්කාළු අපදියර ප්‍රතිකර්ම පද්ධතියේ ඉදිකිරීම් කටයුතු 90%ක් පමණ නිම කිරීම | – අරුවක්කාළු කසල රඳවනය වෙත කසල ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් විවිධ පාර්ශව වෙතින් එල්ල වූ විරෝධතා<br>– කැළනිය හුවමාරු මධ්‍යස්ථානය හා අරුවක්කාළු කසල රඳවනයේ ඉදි කිරීම් කටයුතු වලට අදාළ සැලසුම් ප්‍රමාද වීම |

# 6. පරිච්ඡේදය

## මානව සම්පත් පැතිකඩ

### 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| # | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත) | |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 38 | 31 | 7 | ඇබෑර්තු |
| තෘතීයික | 6 | 2 | 4 | ඇබෑර්තු |
| ද්විතියික | 95 | 77 | 18 | ඇබෑර්තු |
| ප්‍රාථමික | 44 | 37 | 7 | ඇබෑර්තු |

### 6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය :

